IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - II වසර

**(පළුවන සමෙසේතරය - සිංහල මාධ්‍යය)**

**(පවත්වන ලද්දේ 2025 පෙබරවාරි/මාර්තු)**

# BLM 2132 – Principles and Themes in Political Science

අයදුම්කරුවන්ට

උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි (03).

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිගෙන් විමසන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ හැඳින්වීමක් කොට එම විෂය හැදෑරීමේ ඇති

වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. දේශපාලන විද්‍යාවට අනුව රාජ්‍ය සහ රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ සංකල්පය පැහැදිලි කොට රාජ්‍යයක මූලික අංග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂයකින් ඉටුවිය යුතු කාර්යභාරය පිළිබඳ සැකෙවින් හඳුන්වාදී ශ්‍රී ලාංකික පක්ෂවලින් එම භූමිකාව කොතෙක් දුරට ඉටුවේදැයි විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු කෙටියෙන් පැහැදිලි කොට ජාතික රාජ්‍ය බිහිවීම නිසා යුරෝපයේ ඇති වූ වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. " යහපත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා පුරවැසියෙකුට අයිතිවාසිකම් මෙන්ම යුතුකම් ද වැදගත් වේ." අයිතිවාසිකම් හා යුතුකම් වල ප්‍රභවය හා විකාශනය හඳුන්වා දෙමින් මේවායෙහි ඇති අන්තර් සම්බන්ධතාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06 දේශපාලන විද්‍යාවේ ඉගැන්වෙන නිදහස පිළිබඳ සංකල්පය සැකෙවින් හඳුන්වාදී පුද්ගල නිදහස භුක්ති විඳීමේ දී සමානාත්මතාවය බිඳී යන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

07 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමන්දැයි නිර්වචනය කොට මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය විස්තර කරන්න.

(ලකුණු 20)

08 " වත්මන් දේශපාලන ක්ෂේත්‍රයේ බලපෑම් කණ්ඩායම් විශාල කාර්යභාරයක් ඉටු කරයි." බලපෑම් කණ්ඩායම් වල කාර්යභාරය කෙටියෙන් විස්තර කරමින් මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

(ලකුණු 20)

**********************